රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 21/2025

මගේ අංකය: PA/CS/6/දු.ලි.සේ.අන්තර්ග්‍රහණ
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2025.09.03

ලේකම්,
ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

**<u>දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ලිපිකාර සේවයේ හා දුම්රිය කාලගණක ලිපිකරු සේවයේ නිලධාරීන් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය කිරීම</u>**

අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක.22/0874/510/016 සම්බන්ධයෙන් වූ 2022.07.04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් දුම්රිය ලිපිකාර සේවයේ හා දුම්රිය කාලගණක ලිපිකරු සේවයේ නිලධාරීන් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය කිරීමට ලබා දුන් නියෝගය අනුව නිකුත් කරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/2025 ප්‍රකාරව අන්තර්ග්‍රහණයවීම සඳහා සුදුසුකම් සපුරන සහ මනාපය පළ කරන 2010.09.15 දිනට සේවයේ නියුතුව සිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ලිපිකාර සේවයේ හා දුම්රිය කාලගණක ලිපිකරු සේවයේ නිලධාරීන් මෙහි මතු දැක්වෙන කොන්දේසි හා විධිවිධානයන්ට යටත්ව එදින සිට බලපවත්වන පරිදි රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

**02.** පාලනය:-

(අ) ඒ අනුව මෙ වන තෙක් එම නිලධරයන් පාලනය වූ දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ලිපිකාර සේවයේ හා දුම්රිය කාලගණක ලිපිකරු සේවයේ තනතුරු සම්බන්ධයෙන් වූ බඳවාගැනීම් පරිපාටි හා විධිවිධාන වෙනුවට 2010.09.15 දිනට බලාත්මක රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවෙහි සහ එම සේවා ව්‍යවස්ථාවෙහි කලින් කලට සිදු කරනු ලබන සංශෝධනයන්හි පූර්ණ පාලනයට යටත් වේ.

(ආ) තවද 2010.09.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ලිපිකාර සේවයේ හා දුම්රිය කාලගණක ලිපිකරු සේවයේ සිට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය වන නිලධාරීන්ගේ තනතුරු, විශ්‍රාම යාමට මනාපය පළ කරන නිලධාරීන්ගේ තනතුරු සහ දුම්රිය දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත තනතුරක සේවය කිරීමට මනාපය පළකරන නිලධාරීන් විශ්‍රාම යාමෙන් අනතුරුව එම තනතුරු, මෙම චක්‍රලේඛයේ 03 වන වගන්තියේ විධිවිධානයන්ට යටත්ව යටපත් වන අතර එම තනතුරු සංඛ්‍යාවට සමානව අදාළ ඒකාබද්ධ සේවාවන්හි තනතුරු සංඛ්‍යාවක් ඇතිවේ.

(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006හි අර්ථ දක්වා ඇති පරිදි, අන්තර්ග්‍රහණය කරනු ලබන අධි පන්තියේ නිලධරයන්ගේ පත්කිරීම් බලධාරියා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වන අතර අන්තර්ග්‍රහණය කරනු ලබන I/II/III පන්තියේ නිලධරයන්ගේ පත්කිරීම් බලධාරියා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වේ.

**03.** අන්තර්ග්‍රහණය:-

මේ යටතේ මනාපය පළකල හැකි ආකාර 3කි.

I. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණයවීමට මනාපය පළකිරීම
II. දුම්රිය දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත, දරන්නාට පෞද්ගලික වන තනතුරක සේවය කිරීමට මනාපය පළකිරීම
III. මෙම චක්‍රලේඛය නිකුත් කරන දින සිට විශ්‍රාම යාමට මනාපය පළකිරීම

3.1. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණයවීමට මනාපය පළකිරීම

3.1.1 රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණයවීමට මනාපය පළකල අන්තර්ග්‍රහණය කළ හැකි නිලධරයන්:-

I. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය කරනු ලබන්නේ ඒ ඒ කාල වකවානුවලට අදාළව ඒකාබද්ධ සේවයේ වලංගුව පැවති, විධිමත්ව අදාළ බලධරයන් විසින් අනුමත කරන ලද සේවා ව්‍යවස්ථාවේ හෝ බඳවා ගැනීමේ පරිපාටියට හෝ උසස් කිරීමේ පරිපාටියට අනුකූලව බඳවා ගනු ලැබ ඇති හා උසස් කිරීම් කරනු ලැබ ඇති දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ලිපිකාර සේවයේ නිලධරයන් / අධි පන්තියේ නිලධරයන් හා දුම්රිය කාලගණක ලිපිකරු සේවයේ නිලධරයන් /අධි ශ්‍රේණියේ නිලධරයන් පමණි.

II. රජයේ ප්‍රතිපත්ති මත සිදු කරනු ලබන මෙම අන්තර්ග්‍රහණයේදී 2010.09.15 දිනට සේවයේ නියුතුව සිටි, අන්තර්ග්‍රහණයවීම සඳහා මනාපය පළ කරන දුම්රිය ලිපිකාර සේවයේ අධි පන්තියේ නිලධරයන් හා දුම්රිය කාලගණක ලිපිකරු සේවයේ අධි ශ්‍රේණියේ නිලධරයන් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධි පන්තියටත්, දුම්රිය ලිපිකාර සේවයේ හා දුම්රිය කාලගණක ලිපිකරු සේවයේ නිලධාරීන් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයටත් අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006හි සඳහන් පන්ති ක්‍රමයට අනුරූපීව දුම්රිය ලිපිකාර සේවයේ හා දුම්රිය කාලගණක ලිපිකරු සේවයේ නිලධරයන් පහත පරිදි 2010.09.15 දින සිට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අදාළ පන්තිවලට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

අ.

| 2010.09.14 වන දිනට දුම්රිය ලිපිකාර සේවයේ සිටින පන්තිය / ශ්‍රේණිය | 2010.09.15 වන දිනට අදාළ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අන්තර්ග්‍රහණය කරන පන්තිය |
|---|---|
| II පන්තිය 'ආ' ඛණ්ඩය | රාජ්‍ය කළමනාකරණ සහකාර III පන්තිය |
| II පන්තිය 'අ' ඛණ්ඩය | -එම- II පන්තිය |
| I පන්තිය | -එම- I පන්තිය |
| අධි පන්තිය (කාර්යාල කළමනාකරණ ශ්‍රේණිය) | අධි පන්තිය |

ආ.

| 2010.09.14 වන දිනට දුම්රිය කාලගණක ලිපිකරු සේවයේ සිටින පන්තිය / ශ්‍රේණිය | 2010.09.15 වන දිනට අදාළ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අන්තර්ග්‍රහණය කරන පන්තිය |
|---|---|
| II'ආ' | රාජ්‍ය කළමනාකරණ සහකාර III පන්තිය |
| II 'අ' | -එම- II පන්තිය |
| I පෙළ | -එම- I පන්තිය |
| අධි ශ්‍රේණිය | අධි පන්තිය |

**3.1.2** රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණයවීමට මනාපය පළකල ද අන්තර්ග්‍රහණය කළ නොහැකි නිලධරයන්:-

I. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හඳුනාගනු ලබන අන්තර්ග්‍රහණය කිරීම තුළින් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධි පන්තියේ / ශ්‍රේණියේ නිලධාරීන් අතර විෂමතාවයක් ඇතිවිය හැකි සහ දුම්රිය ලිපිකාර සේවයේ හා දුම්රිය කාලගණක ලිපිකරු සේවයේ බඳවා ගැනීම් පටිපාටියට අනනුකූලව හා 2010.09.15 දිනට බලාත්මකව පැවති රාජ්‍ය කළමනාකරණ සහකාර

සේවා ව්‍යවස්ථාවට පටහැනිව උපයාගෙන ඇති සහනයක්/උසස්වීමක් සහිත දුම්රිය ලිපිකාර සේවයේ අධිපන්තියේ නිලධරයන්, දුම්රිය ලිපිකාර සේවයේ නිලධරයන්, දුම්රිය කාලගණක ලිපිකරු සේවයේ අධි ශ්‍රේණියේ නිලධරයන් සහ දුම්රිය කාලගණක ලිපිකරු සේවයේ නිලධරයන් අන්තර්ග්‍රහණය කිරීම හෝ එම නිලධාරීන් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරනු ලබන ආකාරය හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

II. තව ද අන්තර්ග්‍රහණයවීමට මනාපය පළ කරනු ලබන එහෙත් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අන්තර්ග්‍රහණය කිරීමට අදාළ අවශ්‍යතාවයන් සම්පූර්ණ කර නොමැති නිලධාරීන් ලෙස හඳුනාගනු ලබන නිලධාරීන් සඳහා නැවත මනාපයක් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙනු ලැබේ. එහිදී එම නිලධාරීන්ට විශ්‍රාම ගැනීමට හෝ දෙපාර්තමේන්තුගත, දරන්නාට පෞද්ගලික වන තනතුරක සේවය කිරීමට මනාපය පළකල හැක.

**3.2 දුම්රිය දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත තනතුරක සේවය කිරීමට මනාපය පළකල නිලධරයන්:-**

මෙම චක්‍රලේඛය අනුව මනාපය පළකිරීමට අවස්ථාව සලසා ඇති අවසන් දිනට ඒකාබද්ධ සේවයට අන්තර්ග්‍රහණයවීමට හෝ විශ්‍රාම යාමට මනාපය පළකර නොමැති නිලධරයන්ට පමණක් පෞද්ගලික වන සේ, දුම්රිය දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ සේවයට අයත් නොවන දෙපාර්තමේන්තුගත තනතුරක 2010.09.15 දින සිට විශ්‍රාම ගන්නා තෙක් රැඳී සිටීමට අවකාශ සලසා දෙනු ලැබේ. (ඔවුන් විශ්‍රාම ගැනීමෙන් පසු එම තනතුර අහෝසිවීමේ පදනම මත).

**3.3 මෙම චක්‍රලේඛය නිකුත් කරන දින සිට විශ්‍රාම යාමට මනාපය පළ කරන නිලධරයන්:-**

අන්තර්ග්‍රහණයවීම සඳහා ලබාදී ඇති නියමිත දිනට අන්තර්ග්‍රහණයවීමට මනාපය පළනොකර විශ්‍රාම ගැනීමට මනාපය පළකරන නිලධරයන් 2025.10.07 දින හෝ අවසන් වරට සේවයට වාර්තා කළ දිනය යන දිනවලින් පළමුව එළඹෙන දිනයේ සිට විශ්‍රාම ගැන්වීමට ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම් විසින් කටයුතු කළ යුතුය. විශ්‍රාම ගන්වනු ලබන නිලධරයන්ට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 07 වගන්තියේ දැක්වෙන වරප්‍රසාද හිමි වේ.

**3.4 කිසිදු මනාප පත්‍රයක් ඉදිරිපත් කර නොමැති නිලධරයන්**

3.4.1 අන්තර්ග්‍රහණයවීම සඳහා ලබාදී ඇති නියමිත දිනට කිසිදු මනාප පත්‍රයක් ඉදිරිපත් කර නොමැති නිලධරයන් සඳහා නැවත මනාපයක් ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙනු ලැබේ. එහිදී එම නිලධාරීන්ට පහත පරිදි මනාපය පළකල හැක.

I. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණයවීම මනාපය පළකිරීම
II. දුම්රිය දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත, දරන්නාට පෞද්ගලික වන තනතුරක සේවය කිරීමට මනාපය පළකිරීම
III. මෙම චක්‍රලේඛය නිකුත් කරන දින සිට විශ්‍රාම යාමට මනාපය පළකිරීම

3.4.2 එම අවස්ථාවේදී ද මනාපය පළකර නොමැති නම්, එම නිලධාරීන් 2025.10.07 දින සිට හෝ අවසන් වරට සේවයට වාර්තා කළ දිනය යන දිනවලින් පළමුව එළඹෙන දිනයේ සිට විශ්‍රාම ගැන්වීමට ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම් විසින් කටයුතු කළ යුතුය. විශ්‍රාම ගන්වනු ලබන නිලධරයන්ට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 07 වගන්තියේ දැක්වෙන වරප්‍රසාද හිමි වේ.

**3.5 2010.09.15 දින සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/2025 අනුව අන්තර්ග්‍රහණයවීම සඳහා මනාපය පළ යුතු අවසන් දිනය වන 2025.10.07 දින දක්වා විශ්‍රාම ගන්නා ලද නිලධරයන්:-**

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය කරනු ලබන 2010.09.15 දින සිට අන්තර්ග්‍රහණ චක්‍රලේඛය නිකුත් කරන ලද 2025.09.03 දින දක්වා දුම්රිය ලිපිකාර සේවයෙන් හා දුම්රිය කාලගණක ලිපිකරු සේවයෙන් විශ්‍රාම ගත් නිලධරයන්ට ඔවුන්ගේ කැමැත්ත පරිදි

අන්තර්ග්‍රහණයවීමට මනාපය පළකල හැකිය. අන්තර්ග්‍රහණයවීම තුළින් තමාට සිදුවිය හැකි අවාසි සහගත තත්වයන් සම්බන්ධව දැනුවත්ව මනාපය පළකිරීම එම නිලධරයන්ගෙන් අපේක්ෂා කෙරේ.

3.6 කිසිදු නිලධාරියෙකුට අන්තර්ග්‍රහණයවීමට / නොවීමට හෝ විශ්‍රාම ගැනීමට හෝ මනාප පත්‍රයක් ඉදිරිපත් නොකර සිටීමට අවස්ථාවක් නොමැති අතර, යම් නිලධරයෙකු මනාප පත්‍රයක් ඉදිරිපත් නොකරන විට දී එම නිලධාරීන් කිසිදු මනාපයක් පළ නොකල, ස්වකැමැත්තෙන් විශ්‍රාම ගැනීමට මනාපය පළකල නිලධාරියෙකු සේ සලකා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 07 වැනි වගන්තියෙහි විධිවිධාන පරිදි විශ්‍රාම ගැන්වීමට ක්‍රියා කරනු ලැබේ. තව ද වරක් ප්‍රකාශ කරන ලද මනාපය පසුව වෙනස් කිරීමට කිසිසේත්ම අවස්ථාවක් දෙනු නොලබන බැවින් ඒ සම්බන්ධව පසුව කරනු ලබන අභියාචනා සලකා බලනු නොලැබේ.

3.7 අදාළ මනාප ප්‍රකාශ කිරීම සඳහා නිලධරයන් මෙම චක්‍රලේඛය සමග ඇති ආකෘතිය අනුව සකස් කර සම්පූර්ණ කරන ලද මනාප ප්‍රකාශ පත්‍රයක් 2025.10.07 දිනට පෙර දුම්රිය සාමාන්‍යාධිකාරී සහ ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම් මගින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය.

3.8 රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ ව්‍යවස්ථා විධිවිධානයන්ට සහ මෙම චක්‍රලේඛයේ දැක්වෙන විධිවිධානවලට යටත්ව රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණයවීමට 2025.10.07 දින හෝ එදිනට පෙර මනාපය පළ කරනු ලබන නිලධරයන් 2010.09.15 දින සිට අදාළ ඒකාබද්ධ සේවාවට අන්තර්ග්‍රහණය කිරීමේ ලිපිය ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ඇත.

3.9 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 07 වගන්තිය යටතේ තනතුර අහෝසිවීම මත විශ්‍රාම වැටුපක් ලැබීමේ හිමිකම ලැබීම සඳහා මාස 120ක (එකසිය විස්සක) දල සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු බව ද ඊට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇතොත් හිමිකම ලබනුයේ පාරිතෝෂිකයකට පමණක් බව ද එම ව්‍යවස්ථා සංග්‍රහයේ දැක්වේ. එබැවින් විශ්‍රාම වැටුපක් ලැබීමේ හිමිකම සඳහා සේවා කාලය අඩුවීම පිළිබඳව පසුව ඉදිරිපත් කරන අභියාචනයන් සලකා බැලිය නොහැකි බැවින් ඒ පිළිබඳව සැලකිලිමත්ව සිය මනාපය ප්‍රකාශ කිරීමට නිලධරයන් වග බලාගත යුතුය.

**04. චක්‍රලේඛයේ විධිවිධාන නිලධරයන්ට දැන්වීම.**

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණයවීම සඳහා මනාපය ප්‍රකාශ කිරීමට දී ඇති කාලය 2025.10.07 දිනෙන් අවසන් වේ. ඒ අනුව තම මනාප ප්‍රකාශ පත්‍රය අවසාන දිනට පෙර එවන ලෙස ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම් විසින් දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ලිපිකාර සේවයේ හා දුම්රිය කාලගණක ලිපිකරු සේවයේ තනතුරුවල සේවය කරන අදාළ නිලධරයන්ට දැන්විය යුතුය. දීර්ඝකාලීනව දේශීය නිවාඩු ලබා සිටින, විධිමත් ලෙස විදේශ නිවාඩු ලබා විදේශගතව සිටින, වෙනත් ආයතනවලට තාවකාලිකව මුදාහැර ඇති, වැඩ තහනම් කර ඇති, අනිවාර්ය නිවාඩු යවා ඇති සහ සේවය අත්හිටුවා ඇති නිලධරයන්ට ද ඔවුන් විසින් අවසන් වරට දැනුම් දී ඇති ලිපිනයන්ට ලියාපදිංචි තැපෑලෙන් මේ බව දන්වා යැවිය යුතු වේ.

**05. මනාප ප්‍රකාශ පත්‍ර ඉදිරිපත් කිරීම :-**

I. මනාප ප්‍රකාශ පත්‍ර ඉදිරිපත් කිරීමේ දී දුම්රිය සාමාන්‍යාධිකාරී / ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම් විසින් පහත දැක්වෙන කරුණු සැලකිල්ලට ගත යුතුය.

i. ප්‍රකාශ පත්‍රයේ ඇතුළත් කර ඇති තොරතුරු නිවැරදි බව.

ii. සහතික කරන නිලධරයා දිනය යොදමින් සහතික කර අත්සන් තබා දින මුද්‍රා/ නිල මුද්‍රා තබා ඇති බව.

iii. ප්‍රකාශ පත්‍රයේ අනු පිටපතක් නිලධරයාගේ දෙපාර්තමේන්තු පෞද්ගලික ලිපිගොනුවේ ඇතුළත් කර ඇති බව.

II. අන්තර්ග්‍රහණයවීමට මනාපය පළ කරන ලද නිලධරයන්ගේ මනාප ප්‍රකාශ පත්‍ර පමණක් (මුල් පිටපත්) ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතුය. එමෙන්ම මෙම චක්‍රලේඛයට අමුණා ඇති "අ" ආකෘතියට අනුකූලව සකස් කරන ලද ලේඛනයක් මනාප ප්‍රකාශ පත්‍ර සමග එවිය යුතුය. මනාප ප්‍රකාශ පත්‍ර ලැබුණු බවට ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම් විසින් අදාළ නිලධරයා වෙත ලිඛිතව දැන්විය යුතු වේ.

III. ඒ අනුව අන්තර්ග්‍රහණයවීමට මනාපය පළ කරන ලද නිලධරයන් වෙනුවෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉදිරියේ දී නඩත්තු කිරීමට නියමිත ප්‍රධාන ලිපි ගොනුව (Master file) ලෙස නව ලිපි ගොනු සකසා අවශ්‍ය මූලික ලිපිවල සහතික කරන ලද පිටපත් ඇතුළත් කරන ලද, එක් එක් නිලධරයා වෙනුවෙන් සැකසූ එම ගොනුව,

i. සම්පූර්ණ කරන ලද චර්යා සටහන් පත්‍රිකා සහතික කර මනාප ප්‍රකාශ පත්‍රය ද
ii. පරීක්ෂා කිරීමේ ලේඛනය (check list) ද

සමග නොපමාව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත භාර දිය යුතු ය. ඒ සමගම අදාළ නිලධාරීන් වෙනුවෙන් දුම්රිය දෙපාර්තමේන්තුව විසින් නඩත්තු කරන ලද පෞද්ගලික ලිපිගොනුව ද එවිය යුතු අතර අන්තර්ග්‍රහණ ලිපිය ද සමග එම ලිපිගොනුව ආපසු දෙපාර්තමේන්තුව වෙත එවනු ලැබේ.

IV. අන්තර්ග්‍රහණය නොවී විශ්‍රාම ගැනීමට මනාපය පළ කරන නිලධරයන්ගේ ලේඛනයක් "ආ" ආකෘතිය අනුව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය.

V. විනය ක්‍රියාමාර්ගවලින් වරදකරු වී විනය නියෝග නිකුත් කර ඇති නිලධරයන්ගේ පෞද්ගලික ලිපිගොනුවලට, අදාළ විනය නියෝගය හා චෝදනා පත්‍රය ඇතුළත් කර ඉදිරිපත් කළ යුතුය.

**06.** මනාපය ප්‍රකාශ කරන කාලය තුළ සේවයේ නොසිටි නිලධරයන්

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණයවීමට මනාපය ප්‍රකාශ කිරීමට දී ඇති අවසන් දිනයට (2025.10.07) හෝ ඊට පෙර මනාපය ප්‍රකාශ කිරීමට නොහැකි වූ, ඒ වන විට සේවයේ නියුක්ත නොවූ, සිය ධූරය හැරගියා සේ සලකා ඇත්තා වූ හෝ සේවය අවසන් කළ හෝ සේවයෙන් පහකළ අයෙකු සම්බන්ධයෙන් නැවත සේවයේ පිහිටුවීමට විනය බලධාරියා විධිමත් නියෝගයක් දී ඇති කල්හි එවැනි නිලධරයෙකුට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණයවීමට හෝ පූර්ව සේවය යටතේ අවසන් වරට සේවය කළ දින සිට පූර්ව සේවයෙන් විශ්‍රාම යාමට යන කුමන හෝ මනාපයක් පළ කිරීමට, නැවත සේවයට වාර්තා කල දින සිට එක් ලිත් මාසයකට නොවැඩි කාලයක් කල් දිය යුතු වේ. එලෙස අන්තර්ග්‍රහණයවීමට මනාපය පළ කරනු ලබන නිලධරයන් ද මෙම චක්‍රලේඛයේ 3 වගන්තියේ දක්වා ඇති විධිවිධානයන්ට යටත් වනු ඇත. එසේ කිසිදු මනාපයක් පළ කිරීමෙන් වැළකී සිටීමට නැවත සේවයේ පිහිටුවන ලද කිසිදු නිලධරයෙකුට අවසර නොමැත.

**07.** වැටුප හා ජ්‍යෙෂ්ඨත්වය සහ උසස්වීම.

අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධරයන්ගේ ජ්‍යෙෂ්ඨත්වය තීරණය කරනු ලබන්නේ ඔවුන් පත්වීම් දිනයේ සිට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සමාන තනතුරක සිටියා නම් 2010.09.15 දිනට උපයාගත හැකිව තිබූ ජ්‍යෙෂ්ඨත්වය නොඉක්මවන පරිදි (එනම් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවාවේ එදිනට සිටි නිලධරයන්ගේ ජ්‍යෙෂ්ඨත්වය අභිබවා නොයන පරිදි) පහත දැක්වෙන විධිවිධානවලට යටත්ව ය.

I. දුම්රිය ලිපිකාර සේවයේ හා දුම්රිය කාලගණක ලිපිකරු සේවයේ තනතුරුවලට අදාළ විධිවිධාන පරිදි නිලධරයන් විසින් 2010.09.15 දිනට උපයාගෙන ඇති වැටුප් වර්ධකයන්ට සමාන සංඛ්‍යාවකට අනුරූපී වන ලෙස රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ වැටුප් පියවර ලබා දෙනු ලබන අතර වැටුප් වර්ධක දිනයේ වෙනසක් සිදු නොවේ.

II. අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධරයන් 2010.09.15 දිනට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සිටින, එම නිලධාරියාට සමාන හෝ ඊට වැඩි සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියෙකුගේ ජ්‍යෙෂ්ඨත්වයට පහළින් තැබිය යුතුය. එම නිලධරයන් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අදාළ ඊළඟ උසස්වීම් ලබා ගැනීමේ දී ඔවුන්ගේ පූර්ව සේවා කාලය ද සලකා බලමින් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සේවා ව්‍යවස්ථාව අනුව උසස්වීම් ලබාදීමට කටයුතු කරනු ලැබේ.

III. එම නිලධරයන් දුම්රිය ලිපිකාර සේවයේ හෝ දුම්රිය කාලගණක ලිපිකරු සේවයේ ඔවුන් සිටි පන්තියට / ශ්‍රේණියට උසස්වීම් ලැබීමේ දී අදාළ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ ඒ හා සමාන පන්තියට / ශ්‍රේණියට උසස්වීම ලැබීම සඳහා එම කාල වකවානුවට අදාළව බලපැවැත්වූ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සේවා ව්‍යවස්ථාව අනුව සම්පූර්ණ කළ යුතු සේවා කාලයට වඩා අඩු සේවා කාලයකින් පත්ව සිටියේ නම්, එම අඩු වූ කාලය අදාළ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ දී ඔවුනට නියමිත ඊළඟ උසස්වීම ලබාගැනීම සඳහා සම්පූර්ණ කළ යුතුය.

උදාහරණ:

1. සේවා කාලය මත උසස්වීම් ලබා දීමේදී දුම්රිය ලිපිකාර සේවයේ දුම්රිය ලිපිකරු II 'ආ' බණ්ඩයේ වසර 10ක සේවා කාලයක් සපුරන දින සිට II'අ' බණ්ඩයට පත්ව ඇත්නම් අන්තර්ග්‍රහණයෙන් පසුව එම නිලධරයා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I පන්තියට උසස් කිරීම සඳහා අමතර වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කළ යුතුය.

2. 2006.12.31 දිනෙන් පසුවද යම් නිලධරයකු දුම්රිය ලිපිකරු II 'අ' බණ්ඩයේ වසර 12ක සේවා කාලයක් සපුරන දින සිට I පන්තියට පත්ව ඇත්නම් අන්තර්ග්‍රහණයෙන් පසුව රාජ්‍ය කළමනාකරණ සහකාර සේවාවේ I පන්තිය අදාළ කරගත් යම් උසස්වීමකට ඉදිරිපත් විය හැක්කේ එම නිලධරයා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාව අනුව I පන්තියට උසස්වීම ලබා ගැනීම සඳහා සම්පූර්ණ කළ යුතු සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව පමණි.

3. යම් නිලධරයකු දුම්රිය කාලගණක ලිපිකරු II 'අ' බණ්ඩයේ වසර 10ක සේවා කාලයක් සපුරන දින සිට I පන්තියට පත්ව ඇත්නම් අන්තර්ග්‍රහණයෙන් පසුව රාජ්‍ය කළමනාකරණ සහකාර සේවාවේ I පන්තිය අදාළ කරගත් යම් උසස්වීමකට ඉදිරිපත් විය හැක්කේ එම නිලධරයා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාව අනුව I පන්තියට උසස්වීම ලබා ගැනීම සඳහා සම්පූර්ණ කළ යුතු සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව පමණි.

IV. එමෙන්ම අන්තර්ග්‍රහණය කරන ලද යම් නිලධරයෙකු දුම්රිය ලිපිකාර සේවයේ හෝ දුම්රිය කාලගණක ලිපිකරු සේවයේ ඔවුන් සිටි පන්තියට/ ශ්‍රේණියට උසස්වීම් ලැබීමේදී එම කාලසීමාවට අදාළව බලපැවැත්වූ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාව අනුව සම්පූර්ණ කළ යුතු සේවා කාලයට වඩා වැඩි සේවා කාලයකින් පත්ව සිටියේ නම්, එම වැඩි වූ කාලය රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාව අනුව ඔවුනට හිමිවන ඊළඟ උසස්වීමේදී සම්පූර්ණ කළ යුතු සේවා කාලයෙන් අඩු කරනු ලැබේ.

**08. ස්ථිර කිරීම් සහ කාර්යක්ෂමතා කඩඉම් හා රාජ්‍ය භාෂාවන්හි ප්‍රවීණතාවය :-**

8.1.1 2010.09.15 දින වන විට බලපවත්වන රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාව (එහි සංශෝධනයන් ද ඇතුළත්ව) යටතේ දැක්වෙන ස්ථිර කිරීම සහ කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධව විධිවිධාන අන්තර්ග්‍රහණය කරන ලද නිලධරයන්ට අදාළ වේ. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයෙන් සලසා ඇති විධිවිධානයන් යටතේ මිස අන්තර්ග්‍රහණයෙන් පසුව ඒ ඒ ශ්‍රේණීන්ට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස්වීමට කිසිදු නිලධරයෙකුට අවකාශ නොලැබේ.

8.1.2 අන්තර්ග්‍රහණය කරනු ලබන රාජ්‍ය කළමනාකරණ සහකාර සේවාවේ පන්තියට අදාළ කාර්යක්ෂමතා කඩඉම අසමත් හෝ කොටසක් පමණක් සමත් නිලධරයන්ට කාර්යක්ෂමතා කඩඉම සමත්වීම සඳහා පත්වීමේ / උසස්වීමේ දින සිට පූර්ව සේවයේදී ලද විභාග අවස්ථාවන් ද ඇතුළුව රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ප්‍රකාරව සහන කාලයක් ලබාදෙනු ලැබේ. එම සහන කාලය ඇතුළත අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට/ සම්පූර්ණ කිරීමට නොහැකි වන නිලධරයන්ගේ වැටුප් වර්ධකය එම සහන කාලය අවසන් වන දින සිට එය සමත් වන/ සම්පූර්ණ කරනු ලබන දිනය දක්වා විලම්භනය කරනු ලැබේ. තව ද අදාළ කාර්යක්ෂමතා කඩඉම නියමිත දිනට සමත් නොවීම / සම්පූර්ණ නොකිරීම මත අන්තර්ග්‍රහණය කරනු ලබන දිනට, එනම් 2010.09.15 දිනට පෙරාතුව සිදු වූ කිසියම් වැටුප් වර්ධක විලම්භනයක් තිබේනම් එම වැටුප් වර්ධක විලම්භනය මෙමගින් ප්‍රතිසාධනය නොවන අතර එය එසේම පවතිනු ඇත.

සටහන : අන්තර්ග්‍රහණය වන දිනට පෙර සේවා කාලයට අදාළව කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් නොවීම හේතුවෙන් වැටුප් වර්ධක විලම්භනය කිරීම්වලට අදාළ සහන ලබා දීම සඳහා වන ඉල්ලීම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

8.1.3 රාජ්‍ය භාෂාවන්හි ප්‍රවීණතාවය සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල විධිවිධානයන් අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධරයන්ටද අදාළ වේ.

**8.2 කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/2025 නිකුත් කරන ලද 2025.09.03 දින වන විට පෙර සේවාවේ කාර්යක්ෂමතා කඩඉම සමත්ව ඇති දුම්රිය ලිපිකාර සේවයේ හා දුම්රිය කාලගණක ලිපිකරු සේවයේ නිලධරයන් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අදාළ අනුරූපී පන්තියට/ ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

i. දුම්රිය ලිපිකරු සේවයේ හා දුම්රිය කාලගණක ලිපිකරු සේවයේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් අසමත් හෝ කොටසක් පමණක් සමත් නිලධරයන් සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කරනු ලැබේ.

| අන්තර්ග්‍රහණය කරන ලද පන්තිය | දුම්රිය ලිපිකරු සේවාවට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේදී අසමත් විෂයය | අන්තර්ග්‍රහණය කිරීමෙන් පසු රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේදී සමත් විය යුතු විෂයයන් |
|---|---|---|
| III | යතුරු ලියන පරීක්ෂණය | 1. කාර්යාල ක්‍රම<br>2. ගිණුම් ක්‍රම<br>3.පරිගණක පරීක්ෂණය |
| II | 1. කාර්යාල ක්‍රම | කාර්යාල ක්‍රම |
| | 2. රජයේ කාර්යාලවල භාවිතා වන ගිණුම් ක්‍රම | රජයේ කාර්යාලවල භාවිතා වන ගිණුම් ක්‍රම |
| I | - | 2013.04.02 දින වන විට I පන්තියේ වැටුප් වර්ධක පහක් උපයාගෙන නොමැති නිලධරයන් I පන්තියේ කාර්යක්ෂමතා කඩඉමට අදාළ සියළුම විෂයයන් හෝ අදාළ පාඨමාලාව සමත්විය යුතුය. |
| අන්තර්ග්‍රහණය කරන ලද පන්තිය | දුම්රිය කාලගණක ලිපිකරු සේවාවට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේදී අසමත් විෂයය | අන්තර්ග්‍රහණය කිරීමෙන් පසු රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේදී සමත් විය යුතු විෂයයන් |

| | | |
|---|---|---|
| III | කාර්යාල කාර්ය පරිපාටි පිළිබඳ දැනුම | 1. කාර්යාල ක්‍රම<br>2. ගිණුම් ක්‍රම<br>3.පරිගණක පරීක්ෂණය |
| II | 1. ගිණුම් | රජයේ කාර්යාලවල භාවිතා වන ගිණුම් ක්‍රම |
| | 2. ව්‍යවස්ථා හා කාර්ය පරිපාටිය හා කාර්යාල ක්‍රමය | කාර්යාල ක්‍රම |
| I | - | 2013.04.02 දින වන විට I පන්තියේ වැටුප් වර්ධක පහක් උපයාගෙන නොමැති නිලධරයන් I පන්තියේ කාර්යක්ෂමතා කඩඉමට අදාළ සියළුම විෂයයන් හෝ අදාළ පාඨමාලාව සමත්විය යුතුය. |

සටහන - අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධරයන් තමා අයත් සේවාවේ උපයාගෙන ඇති පන්තිය / ශ්‍රේණියට වඩා පහළ පන්තිය / ශ්‍රේණියකට අන්තර්ග්‍රහණය කර ඇති අවස්ථාවන්හි දී එම නිලධරයා පෙර සේවයේ උපයාගෙන ඇති පන්තිය / ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කර ඇත්නම් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාව අනුව අදාළ පන්තිය / ශ්‍රේණියට උසස් වූ පසු නැවත එම පන්තිය / ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

උදා:දුම්රිය ලිපිකරු සේවයේ II 'අ' ඛණ්ඩයේ නිලධරයකු රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III පන්තියට අන්තර්ග්‍රහණය කර ඇති අවස්ථාවකදී එම නිලධරයා දුම්රිය ලිපිකරු සේවයේ II 'අ' ඛණ්ඩයට අදාළ කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කර ඇත්නම් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාව අනුව II පන්තියට උසස් වූ පසු නැවත II පන්තියට අදාළ කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කළ යුතු නොවේ.

තවද එම නිලධරයා දුම්රිය ලිපිකරු සේවයේ II 'අ' ඛණ්ඩයට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් කොටසක් පමණක් සමත් නම් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාව අනුව II පන්තියට උසස් වූ පසු ඉහත 8.2 i අනුව රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II පන්තියට අදාළ විෂයයන් සමත්ව කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කළ යුතු වේ.

### 8.2.1 අන්තර්ග්‍රහණය කරන ලබන III පන්තියේ නිලධරයන්

i. පූර්ව බඳවා ගැනීම් පටිපාටි යටතේ බඳවා ගන්නා ලද හා සේවයේ ස්ථිර කර ඇති එහෙත් III පන්තියට අදාළ කාර්යක්ෂමතා කඩඉම පරීක්ෂණය අසමත්/ සම්පූර්ණ කර නොමැති නිලධාරීන් හට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම සඳහා අන්තර්ග්‍රහණය කළ දින සිට පූර්ව සේවයේ දී ලද විභාග අවස්ථාවන් ද ඇතුළුව රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ප්‍රකාරව සහන කාලයක් ලබා දෙනු ලැබේ.

ii. සේවයේ ස්ථිර කර නොමැති III පන්තියට (රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ බඳවා ගැනීම් පන්තියට) අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධරයන්ට පූර්ව සේවයේ දී ලද විභාග අවස්ථාවන් ද ඇතුළුව රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ප්‍රකාරව සහන කාලයක් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කිරීම සඳහා ලබා දෙනු ලබන අතර එය සමත්/සම්පූර්ණ කළ පසු පූර්ව බඳවා ගැනීම් පටිපාටි යටතේ ස්ථිර කිරීම ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් කරනු ලැබේ.

### 8.2.2 අන්තර්ග්‍රහණය කරන ලබන II පන්තියේ නිලධරයන්

පූර්ව බඳවා ගැනීම් පටිපාටි යටතේ II පන්තියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/2025 නිකුත් කරන ලද 2025.10.07 දින වන විට සමත්/සම්පූර්ණ කළ II පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධරයන් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා

සංග්‍රහයේ දක්වා ඇති II පන්තියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් වේ.

**8.2.3 අන්තර්ග්‍රහණය කරන ලබන I පන්තියේ නිලධරයන්**

i. I පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධරයන් 2013.04.02 දින වන විට I පන්තියේ වැටුප් වර්ධක පහක් උපයාගෙන ඇත්නම් එම නිලධරයන් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I පන්තියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් වේ.

ii. 2013.04.02 දින වන විට I පන්තියේ වැටුප් වර්ධක පහක් උපයාගෙන නොමැති I පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධරයන් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I පන්තියේ කාර්යක්ෂමතා කඩඉමට අදාළ සියළුම විෂයයන් හෝ අදාළ පාඨමාලාව සමත්විය යුතු අතර ඒ සඳහා අමතර සහන කාලයක් ලබාදීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විමසා කටයුතු කරනු ලැබේ.

**09.** <u>නොනිමි කාර්යයන්</u>

9.1 දුම්රිය ලිපිකාර සේවය හා දුම්රිය කාලගණක ලිපිකරු සේවයේ සිට අන්තර්ග්‍රහණය වන නිලධරයන් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවරන ලද බලතල ප්‍රකාරව, මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන දින දක්වා දුම්රිය සාමාන්‍යාධිකාරී / අමාත්‍යාංශ ලේකම් විසින් ගන්නා ලද හෝ ගනු ලබනු ඇතැයි සැලකෙන යම් ක්‍රියාමාර්ගයකට අගතියක් නොවන පරිදි සියලු ආයතනික හා විනය කටයුතු මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන දින සිට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල පැවරීම අනුව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදු කරනු ලැබේ.

9.2 දුම්රිය ලිපිකාර සේවයේ හෝ දුම්රිය කාලගණක ලිපිකරු සේවයේ සිටියදී චෝදනා පත්‍ර නිකුත් කර ඇති හා විධිමත් විනය පරීක්ෂණ ආරම්භ කර ඇති නිලධරයන්ගේ විනය ක්‍රියාමාර්ග සම්බන්ධව ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 10 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. අනෙකුත් විනය ක්‍රියාමාර්ග පිළිබඳව කටයුතු කිරීමට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළ යුතුය.

9.3 රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරියට හෝ ඉදිරිපත් කර ඇති අභියාචනා සම්බන්ධව තීරණ ලැබුණු පසු එම විනය ලිපිගොනු ද ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය.

**10.** පාඨ අතර අනනුකූලතාවයක් ඇති වූ විට ක්‍රියා කළයුතු ආකාරය.

මෙම චක්‍රලේඛයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනුකූලතාවයක් හෝ පරස්පරතාවක් හෝ ඇති වුවහොත් එවන් අවස්ථාවක සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

**11.** චක්‍රලේඛය මගින් ආවරණය නොවන කරුණු.

මෙම චක්‍රලේඛය මගින් ආවරණය නොවන කරුණු සම්බන්ධව තීරණ ගැනීම ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විමසා අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත්
පාලන අමාත්‍යාංශය.

ඇමුණුම 1

**<u>දුම්රිය ලිපිකාර සේවයේ / දුම්රිය කාලගණක ලිපිකරු සේවයේ නිලධාරීන් ඒකාබද්ධ සේවාවන්ට අන්තර්ග්‍රහණයවීම සඳහා භාවිතා කළ යුතු මනාප ප්‍රකාශය</u>** (අනවශ්‍ය සේවාව කපා හරින්න)

ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශ ලේකම් මගින්
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණයවීම සඳහා කරනු ලබන මනාප ප්‍රකාශය.

01. මුලකුරු සමග නිලධරයාගේ :............................................................................................ මයා/ මිය / මෙනවිය (පත්වීම් ලිපියේ දැක්වෙන නම සඳහන් කරන්න).
02. නම වෙනස් කර ඇත්නම් සංශෝධිත නම :.................................................................................
03. සේවය : ...............................................
04. ශ්‍රේණිය :..........................................
05. දැනට සේවය කරන අංශය හා ලිපිනය : ............................................................................
..........................................................................................................................................
06. ස්ථිර පෞද්ගලික ලිපිනය :.........................................................................................................
07. උපන් දිනය :..................................................................
2010.09.15 දිනට වයස : අවු.......... මාස......... දින.........
08. පත්වීම් ලිපියේ අංකය :..................................... පත්වීම් දිනය :...............................
08.(i).

| | සේවය | තනතුර, පන්තිය / ශ්‍රේණිය | කාලය සිට - දක්වා දිනය |
|---|---|---|---|
| දුම්රිය ලිපිකාර සේවයේ / දුම්රිය කාලගණක ලිපිකරු සේවයේ උසස්වීම් ලැබුන ආකාරය සඳහන් කරන්න. (අනවශ්‍ය සේවාව කපා හරින්න) සේවා කාලය අනුව ද? තරග විභාගයෙන් ද? යන්න | | i. මුල් පත්වීම් දිනය | |
| | | ii. කාර්යක්ෂමතා කඩඉමෙන් සමත්/නිදහස් කළ දිනය | |
| | | iii. ස්ථිර කළ දිනය | |
| | | iv. II ශ්‍රේණියට උසස්වීම ........................... | |
| | | v. කාර්යක්ෂමතා කඩඉමෙන් සමත්/නිදහස් කළ දිනය | |
| | | vi. I ශ්‍රේණියට උසස් වූ දිනය ........................... | |
| | | vii. අධි ශ්‍රේණියට උසස් වූ දිනය | |
| | | viii. 2010.09.15 දිනට ස්ථිර සේවා කාලය | |

08.(ii). පත්වීම් ලිපියේ/උසස්වීම් ලිපියේ, අධි සේවක පදනම මත පත්වීමක් බව සඳහන් කර තිබේද?
.................................................................................................

09.(i). ඔබ උපාධිධරයෙක් ද? ..............................................................
(ii) උපාධිය ලත් වර්ෂය/ කවදා සිට ද? ....................................................

10. (i) රාජ්‍ය පරිපාලන 20/94 චක්‍රලේඛය යටතේ වැටුප් හිමිකම් පවතී ද?...............................
(ii) වර්තමාන වැටුප් පරිමාණය .................................................

(11) (i). දුම්රිය ලිපිකාර සේවයේ / දුම්රිය කාලගණක ලිපිකරු සේවයේ (අනවශ්‍ය සේවාව කපා හරින්න) ............... පන්තියේ / ශ්‍රේණියේ සේවය කරන .................................................................................................................................... (සම්පූර්ණ නම) වන මම ......................... අංක දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය කියවා තේරුම් ගතිමි. එම චක්‍රලේඛයේ සහ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවේ සේවා කොන්දේසි හා වගන්තිවලට යටත්ව රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණයවීමට මනාපය ප්‍රකාශ කරමි.

**මෙම මනාපය කිසිදු ආකාරයකින් නැවත වෙනස් කළ නොහැකි බව තේරුම් ගතිමි.**

නිලධරයාගේ අත්සන:..............................................

නම:..............................................

දිනය:.............................

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ / ආයතන ප්‍රධානියාගේ ප්‍රකාශය**

ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ලිපිකාර සේවයේ / දුම්රිය කාලගණක ලිපිකරු සේවයේ (අනවශ්‍ය සේවාව කපා හරින්න) .............................................. පන්තියේ / ශ්‍රේණියේ නිලධරයෙකු වශයෙන් සේවය කරන ........................................................................................................................ (නම) මයා/මිය/මෙනවිය විසින් ඉහත සඳහන් ප්‍රකාශය ............................... දින ................................................ හි දී මා ඉදිරිපිට දී අත්සන් කළ බව සහතික කරමි. අයදුම්පතේ නිලධරයා / නිලධාරිණිය සඳහන් කර ඇති තොරතුරු ඔහුගේ / ඇයුගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදිය. මෙම නිලධරයා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණයවීමට මනාපය පළ කර ඇති හෙයින් නිලධරයාගේ පෞද්ගලික ලිපිගොනුව සමග මනාප ප්‍රකාශ පත්‍රය ඉදිරිපත් කරමි.

අත්සන:....................................

නම:..........................................

(නිල මුද්‍රාව)

දිනය:............................

සටහන:

01. ඒකාබද්ධ සේවාවකට අන්තර්ග්‍රහණයවීමට මනාපය පළ නොකරන නිලධරයන්ගේ මනාප ප්‍රකාශ පත්‍රය ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත එවීම අවශ්‍ය නොවේ. එම මනාප ප්‍රකාශ පත්‍ර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් ආමන්ත්‍රණය කර තිබුණ ද එවීම අවශ්‍ය නොවන අතර අදාළ නිලධරයාගේ පෞද්ගලික ලිපි ගොනුවේ ගොනුකර තැබීම මැනවි.

ඇමුණුම 2

<u>දුම්රිය ලිපිකාර සේවයේ / දුම්රිය කාලගණක ලිපිකරු සේවයේ නිලධාරීන් දෙපාර්තමේන්තුගත, දරන්නාට පෞද්ගලික වන තනතුරක සේවය කිරීම සඳහා භාවිතා කළ යුතු මනාප ප්‍රකාශය</u>

(අනවශ්‍ය සේවාව කපා හරින්න)

දුම්රිය සාමාන්‍යාධිකාරී, දුම්රිය දෙපාර්තමේන්තුව මගින්,
ලේකම්, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
7 වන මහල
සෙත්සිරිපාය අදියර II
බත්තරමුල්ල.

1. දෙපාර්තමේන්තුගත, දරන්නාට පෞද්ගලික වන තනතුරක සේවය කිරීම සඳහා කරනු ලබන මනාප ප්‍රකාශය.

දුම්රිය ලිපිකාර සේවයේ / දුම්රිය කාලගණක ලිපිකරු සේවයේ (අනවශ්‍ය සේවාව කපා හරින්න) .................. පන්තියේ / ශ්‍රේණියේ සේවය කරන ........................................................................................ ........................(සම්පූර්ණ නම) වන මම .................................. අංක දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය කියවා තේරුම් ගතිමි. එම චක්‍රලේඛයේ විධිවිධානවලට යටත්ව දුම්රිය දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ සේවයට අයත් නොවන දෙපාර්තමේන්තුගත දරන්නාට පෞද්ගලික වන තනතුරක විශ්‍රාම ගන්නා තෙක් රැඳී සිටීමට මනාපය ප්‍රකාශ කරමි.

**මෙම මනාපය කිසිදු ආකාරයකින් නැවත වෙනස් කළ නොහැකි බව තේරුම් ගතිමි.**

නිලධරයාගේ අත්සන:.............................................
නම:.................................................................
දිනය:.............................

**2.** දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ / ආයතන ප්‍රධානියාගේ ප්‍රකාශය

ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ලිපිකාර සේවයේ / දුම්රිය කාලගණක ලිපිකරු සේවයේ (අනවශ්‍ය සේවාව කපා හරින්න) ...................... පන්තියේ / ශ්‍රේණියේ නිලධරයෙකු වශයෙන් සේවය කරන .............................................................................................................. (නම) මයා/මිය/මෙනවිය විසින් ඉහත සඳහන් ප්‍රකාශය .................................. දින ............................................... හි දී මා ඉදිරිපිට දී අත්සන් කළ බව සහතික කරමි. අයදුම්පතේ නිලධරයා / නිලධාරිණිය සඳහන් කර ඇති තොරතුරු ඔහුගේ / ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදිය. මෙම නිලධරයා දුම්රිය දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ සේවයට අයත් නොවන දෙපාර්තමේන්තුගත දරන්නාට පෞද්ගලික වන තනතුරක විශ්‍රාම ගන්නා තෙක් රැඳී සිටීමට මනාපය පළ කර ඇති හෙයින් නිලධරයාගේ පෞද්ගලික ලිපිගොනුව සමග මනාප ප්‍රකාශ පත්‍රය ඉදිරිපත් කරමි.

අත්සන:.........................................
නම:.............................................
*(නිල මුද්‍රාව)*
දිනය:...........................

සටහන:
ඒකාබද්ධ සේවාවකට අන්තර්ග්‍රහණයවීමට මනාපය පළ නොකරන නිලධරයන්ගේ මනාප ප්‍රකාශ පත්‍රය ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත එවීම අවශ්‍ය නොවේ.

ඇමුණුම 3

<u>දුම්රිය ලිපිකාර සේවයේ / දුම්රිය කාලගණක ලිපිකරු සේවයේ නිලධාරීන් මෙම චක්‍ර ලේඛය නිකුත් කරන දින සිට විශ්‍රාම යාම සඳහා භාවිතා කළ යුතු මනාප ප්‍රකාශය</u> (අනවශ්‍ය සේවාව කපා හරින්න)

දුම්රිය සාමාන්‍යාධිකාරී, දුම්රිය දෙපාර්තමේන්තුව මගින්,
ලේකම්, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
7 වන මහල
සෙත්සිරිපාය අදියර II
බත්තරමුල්ල.

2. **මෙම චක්‍රලේඛය නිකුත් කරන දින සිට විශ්‍රාම යාම සඳහා භාවිතා කළ යුතු මනාප ප්‍රකාශය.**
දුම්රිය ලිපිකාර සේවයේ / දුම්රිය කාලගණක ලිපිකරු සේවයේ (අනවශ්‍ය සේවාව කපා හරින්න) .................. පන්තියේ / ශ්‍රේණියේ සේවය කරන ................................................................................................................(සම්පූර්ණ නම) වන මම .................................. අංක දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය කියවා තේරුම් ගතිමි. එම චක්‍රලේඛයේ විධිවිධානවලට යටත්ව රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණයවීමට හෝ දුම්රිය දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ සේවයට අයත් නොවන දෙපාර්තමේන්තුගත දරන්නාට තනතුරක විශ්‍රාම ගන්නා තෙක් රැඳී සිටීමට මනාපය පළ නොකරන හෙයින් චක්‍රලේඛයේ 3.3 වගන්තිය යටතේ විශ්‍රාම ගැනීමට මනාපය ප්‍රකාශ කරමි.

**මෙම මනාපය කිසිදු ආකාරයකින් නැවත වෙනස් කළ නොහැකි බව තේරුම් ගතිමි.**

නිලධරයාගේ අත්සන:...........................................
නම:.................................................................
දිනය:...........................

2. **දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ / ආයතන ප්‍රධානියාගේ ප්‍රකාශය**

ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ලිපිකාර සේවයේ / දුම්රිය කාලගණක ලිපිකරු සේවයේ (අනවශ්‍ය සේවාව කපා හරින්න) ..................... පන්තියේ / ශ්‍රේණියේ නිලධරයෙකු වශයෙන් සේවය කරන ................................................................................................ (නම) මයා/මිය/මෙනවිය විසින් ඉහත සඳහන් ප්‍රකාශය ........................... දින ........................................ හි දී මා ඉදිරිපිට දී අත්සන් කළ බව සහතික කරමි. අයදුම්පතේ නිලධරයා / නිලධාරිණිය සඳහන් කර ඇති තොරතුරු ඔහුගේ / ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදිය. මෙම නිලධරයා චක්‍රලේඛයේ 3.3 වගන්තිය යටතේ විශ්‍රාම ගැනීමට මනාපය පළ කර ඇති හෙයින් නිලධරයාගේ පෞද්ගලික ලිපිගොනුව සමග මනාප ප්‍රකාශ පත්‍රය ඉදිරිපත් කරමි.

අත්සන:.......................................
නම:...........................................
*(නිල මුද්‍රාව)*
දිනය:...........................

සටහන:
ඒකාබද්ධ සේවාවකට අන්තර්ග්‍රහණයවීමට මනාපය පළ නොකරන නිලධරයන්ගේ මනාප ප්‍රකාශ පත්‍රය ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත එවීම අවශ්‍ය නොවේ.

ඇමුණුම 4

**පරීක්ෂා කිරීමේ ලේඛණය (check list)**

ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම් මගින්
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

**දුම්රිය ලිපිකාර සේවයේ / දුම්රිය කාලගණක ලිපිකරු සේවයේ නිලධාරීන් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය කිරීම** (අනවශ්‍ය සේවාව කපා හරින්න)

නිලධාරියාගේ නම: ..............................................................................................

| | | | පිටු අංකය |
|---|---|---|---|
| 01. | ප්‍රාථමික ශ්‍රේණියට මුල් පත්වීමේ ලිපිය | ඇත/නැත | .............. |
| 02. | වැඩ භාර ගැනීමේ ලිපිය | ඇත/නැත | .............. |
| 03. | වෛද්‍ය පරීක්ෂකගේ වාර්තාව | ඇත/නැත | .............. |
| 04. | දිවුරුම හෝ ප්‍රතිඥාව | ඇත/නැත | .............. |
| 05. | වත්කම් හා බැරකම් ප්‍රකාශය | ඇත/නැත | .............. |
| 06. | ගිවිසුම (පොදු 160) | ඇත/නැත | .............. |
| 07. | අධ්‍යාපන සුදුසුකම් සඳහා වූ විභාග ප්‍රතිඵල සනාථ කර | ඇත/නැත | .............. |
| 08. | සේවයේ ස්ථිර කර | ඇත/නැත | .............. |
| 09. | උප්පැන්න සහතිකය | ඇත/නැත | .............. |
| 10. | II ශ්‍රේණියට උසස් කිරීමේ ලිපිය | ඇත/නැත | .............. |
| 11. | I ශ්‍රේණියට උසස් කිරීමේ ලිපිය | ඇත/නැත | .............. |
| 12. | මුල් පත්වීමෙන් පසු නම වෙනස් කර | ඇත/නැත | .............. |

13. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව අදාළ භාෂා ප්‍රවීණතාවය ලබා ඇත/නැත..............
භාෂා ප්‍රවීණතාවය සපුරා ඇති දිනය ....................................

14. කාර්යක්ෂමතා කඩඉම් විභාග
i. III ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය, සමත් වී/නිදහස් කර ඇත/නැත දිනය..........
ii. II ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය, සමත් වී/නිදහස් කර ඇත/නැත දිනය ..........

15. විනය ක්‍රියාමාර්ග ගෙන ඇත/නැත ..............
ඇත්නම් ඒ පිළිබඳ තොරතුරු දක්වා හා අදාළ වන ඡායා පිටපත් යා කරන්න.

16. ද්විතියන පදනම මත මුදාහැරීම කර ඇත/නැත ..............
.............................. දින සිට .......................... දින දක්වා

17. විදේශ නිවාඩු ලබා ඇත/නැත ..............
.............................. දින සිට .......................... දින දක්වා

18. වැටුප් රහිත නිවාඩු ලබා ඇත/නැත ..............

19. යථාවත් කරන ලද චර්යා සටහනෙහි පිටපත ඇත/නැත ..............

20. නිලධාරියාගේ / නිලධාරිණියගේ මනාප ප්‍රකාශය ඇත/නැත ..............

පරීක්ෂා කර ඉදිරිපත් කරමි.

දිනය: ....................................

විෂය ලිපිකරු:- ....................................

නිවැරදි බව සනාථ කරමි.

අත්සන :-....................................

තනතුර :-....................................

දිනය :- ....................................

නිල මුද්‍රාව:-....................................

"අ" ආකෘතිය :

<u>රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණයවීම සම්බන්ධව දුම්රිය ලිපිකාර සේවයේ / දුම්රිය කාලගණක ලිපිකරු සේවයේ නිලධරයන්ගේ මනාප ප්‍රකාශ පත්‍ර එවීමේ ලේඛනය.</u> (අනවශ්‍ය සේවාව කපා හරින්න)

| අනු අංකය | පත්වීම් ලිපියේ අංකය | නිලධරයාගේ නම | පන්තිය/ශ්‍රේණිය | මනාප ප්‍රකාශය කළ දිනය |
|---|---|---|---|---|
| | | | | |

අත්සන :- ............................................
තනතුර :- ............................................
දිනය :- ............................................

නිල මුද්‍රාව:-

සැ:යු: මනාප ප්‍රකාශ පත්‍ර මෙම ආකෘතිය අනුව සැකසූ වාර්තාවක් සමග ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතුය.

"ආ" ආකෘතිය :

**<u>රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණයවීමට මනාපය පළ නොකර දෙපාර්තමේන්තුගත තනතුරක විශ්‍රාම යාම දක්වා රැඳී සිටීමට මනාපය පළ කරන ලද නිලධරයන්ගේ ලේඛනය.</u>**

| අනු අංකය | පත්වීම් ලිපියේ අංකය | නිලධරයාගේ නම | දුම්රිය ලිපිකාර සේවයේ / දුම්රිය කාලගණක ලිපිකරු සේවයේ ශ්‍රේණිය/පන්තිය (අනවශ්‍ය වචන කපා හරින්න) | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය නොවී දෙපාර්තමේන්තුගත තනතුරක විශ්‍රාම යාම දක්වා රැඳී සිටීමට මනාප ප්‍රකාශ කළ දිනය |
|---|---|---|---|---|
| | | | | |

අත්සන :- ............................................

තනතුර :- ............................................

දිනය :- ............................................

නිල මුද්‍රාව:-

"ඇ" ආකෘතිය :

<u>රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණයවීමට මනාපය පළ නොකර විශ්‍රාම ගැනීමට මනාපය පළ කරන ලද නිලධරයන්ගේ ලේඛනය.</u>

| අනු අංකය | පත්වීම් ලිපියේ අංකය | නිලධරයාගේ නම | දුම්රිය ලිපිකාර සේවයේ / දුම්රිය කාලගණක ලිපිකරු සේවයේ ශ්‍රේණිය/පන්තිය (අනවශ්‍ය වචන කපා හරින්න) | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය නොවී විශ්‍රාම ගැනීමට මනාප ප්‍රකාශ කළ දිනය |
|---|---|---|---|---|
| | | | | |

අත්සන :-.............................................
තනතුර :- .............................................
දිනය :- .............................................

නිල මුද්‍රාව:-

"ඇ" ආකෘතිය :

## මෙම චක්‍රලේඛය යටතේ කිසිදු මනාපයක් පළ නොකරන ලද නිලධරයන්ගේ ලේඛනය.

| අනු අංකය | පත්වීම් ලිපියේ අංකය | නිලධරයාගේ නම | දුම්රිය ලිපිකාර සේවයේ / දුම්රිය කාලගණක ලිපිකරු සේවයේ ශ්‍රේණිය/පන්තිය (අනවශ්‍ය වචන කපා හරින්න) | කිසිදු මනාපයක් පළ නොකර අවසන් වරට සේවයට වාර්තා කරන කළ දිනය |
|---|---|---|---|---|
| | | | | |

අත්සන :- ............................................
තනතුර :- ............................................
දිනය :- ............................................

නිල මුද්‍රාව:-